# විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

# පේරාදෙණිය විශ්වවිද්‍යාලය

## 2024/2025 වර්ෂය සඳහා ඡායා පිටපත් සේවාව පවත්වාගෙන යාම සහ එම ස්ථානයේම ආයතනය මගින් අනුමත ද්‍රව්‍ය අලෙවි කිරීම සඳහා අයදුම්පත් කැඳවීම

විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සඳහා 2024/2025 වර්ෂයට ඡායා පිටපත් සේවාව සහ ආයතනය මගින් අනුමත ද්‍රව්‍ය අලෙවි කිරීම සඳහා පළපුරුදු ආයතන සහ පුද්ගලයින්ගෙන් 2024/08/26 දින සිට 2024/09/18 දින පස්වරු 2.30 දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ. ආපසු නොගෙවන රු.1,000.00 ක ගාස්තුවක් මෙම ආයතනයේ සරප් වෙත හෝ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය නමින් පේරාදෙණිය ලංකා බැංකු ශාඛාවේ පවත්වා ගෙන යන ගිණුම් අංක 0081041788 වෙත ගෙවා අදාළ ලදුපත ඉදිරිපත් කිරිමෙන් අයදුම්පත් සහ විස්තර පත්‍රිකා 2024/08/26 දින සිට 2024/09/15 දින දක්වා වැඩ කරන දිනයන්හි පෙරවරු 9.00 සිට පස්වරු.3.00 දක්වා විද්‍යා පශ්චාත් උපාධි ආයතනයෙන් ලබාගත හැකිය. එසේම සෑම අයදුම්පතක් සමඟම මහ බැංකුව මගින් අනුමත වාණිජ බැංකුවක් මගින් නිකුත් කරනු ලබන රු. 6,000.00 ක වටිනාකමකින් යුතු 2024/12/02 දින දක්වා වලංගු ආපසු ගෙවනු ලබන ලංසු ආරක්ෂණයක් හෝ එම මුදල මෙම ආයතනයේ සරප් වෙත ගෙවා අදාළ ලදුපතේ පිටපතක් අයදුම් පත්‍රයට ඇමිණිය යුතුය. නිසි ලෙස සම්පූර්ණ කර මුද්‍රා තබන ලද අයදුම්පත් 2024/09/18 දින පස්වරු. 2.30 හෝ ඊට පෙර ලැබෙන සේ සභාපති, ප්‍රසම්පාදන කමිටුව (සුළු), විද්‍යා පශ්චාත් උපාධි ආයතනය ,තැ. පෙ . 25, පේරාදෙණිය යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීම හෝ විද්‍යා පශ්චාත් උපාධි ආයතතනයේ සහකාර ලේඛකාධිකාරි කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම කළ හැක. අදාළ අයදුම්පත් එදිනම පස්වරු 2.30 ට විවෘත කරනු ලැබේ. ලිපි කවරයේ වම් කෙළවර **"PGIS/NCB/S/2024/01"** වශයෙන් සඳහන් කිරිම අනිවාර්ය වේ. තෝරා ගනු ලබන සැපයුම්කරු විසින් අදාල සේවාව ආරම්භ කිරීමට පෙර ආපසු ගෙවනු ලබන රු. 30,000.00 ක ඇප තැන්පතුවක් තැන්පත් කළ යුතු අතර මාසික විදුලි ගාස්තුව හා මාසික බිම් කුලියක් ද ගෙවිය යුතුයි. මේ සම්බන්ධයෙන් වැඩිදුර විස්තර දු.අ. 081-2394793 ඔස්සේ සහකාර ලේඛකාධිකාරී, විද්‍යා පශ්චාත් උපාධි ආයතනය ඇමතීම මගින් ලබාගත හැක.

සභාපති
ප්‍රතිසම්පාදන කමිටුව (සුළු),විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
තැ. පෙ25 . පේරාදෙණිය
2024/08/26

DIRECTOR
Postgraduate Institute of Science
University of Peradeniya
Peradeniya - Sri Lanka.